# ප්ලේටෝගේ සදාචාර දර්ශනය පිළිබඳ හැඳින්වීමක්

# An Introduction to Plato's Moral Philosophy

කළුබෝවිටියන සෝරත හිමි

**Abstract**

A disciple of Socrates, a revolutionary philosopher found in the history of Western philosophy, Plato has always been an influential philosopher and is considered the first truly systematic thinker of Western intellectual culture. Like many other ancient philosophers, Plato maintains a virtue-based eudemonistic conception of ethics. That is, happiness or well-being eudemonia is the highest goal of moral thought and behavior, and virtue excellence should be evident in it. Plato presents ethics as a template for doing right and living a good life. According to Plato, he questions why most people think about goodness wrongly but not about happiness. The answer lies in the concept of happiness, which has so far been presented as eudemonia. Plato's moral thought is then structured by a broad eudaemonist assumption. His main concern is to challenge many people's ideas about goodness. Because this is where they go disastrously wrong in trying to live a happy life. Many people think that jealousy is of little benefit or a hindrance to happiness. Plato considers this completely wrong. Plato posits that people can hope to be happy only by being virtuous. Accordingly, this article discusses the idea of ethics presented by Plato.

**Keywords:** Ethics, Justice, The Duty, Inherent, Pleasure

**සාරසංක්ෂේපය**

බටහිර දර්ශන ඉතිහාසයේ දාර්ශනික පද්ධතියක් ඉදිරිපත් කළ ප්‍රථම දර්ශනවාදියා සහ සොක්‍රටීස්ගේ ගෝලයෙකු වන ප්ලේටෝ යනු සෑම විටම වඩාත්ම බලගතු දාර්ශනිකයා වූ අතර, ඔහු බටහිර බුද්ධිමය සංස්කෘතියේ පළමු සැබෑ ක්‍රමානුකූල චින්තකයා ලෙස සැලකේ. අනෙකුත් බොහෝ පැරණි දාර්ශනිකයන් මෙන්, ප්ලේටෝ ද ආචාර ධර්ම පිළිබඳ ගුණධර්ම මත පදනම් වූ eudaemonistic සංකල්පයක් පවත්වාගෙන යයි. එනම්, සන්තෝෂය හෝ යහපැවැත්ම (eudaimonia) සදාචාරාත්මක චින්තනයේ සහ හැසිරීමේ ඉහළම අරමුණ වන අතර, ගුණධර්ම විශිෂ්ඨත්වය ඒ තුළින් ප්‍රතීයමාන විය යුතු බව දක්වයි. ආචාර ධර්ම නිවැරදිව ක්‍රියා කිරීමට සහ යහපත් ජීවිතයක් ගත කිරීමට සැලකිල්ලක් ලෙස ප්ලේටෝ පැහැදිලි කරයි. ප්ලේටෝට අනුව බොහෝ මිනිසුන් යහපත්කම ගැන වැරදි ලෙස සලකන නමුත් සතුට ගැන නොසිතන්නේ ඇයිදැයි ප්‍රශ්න කරයි. මෙහි පිළිතුර පවතින්නේ සතුට යන සංකල්පය තුළ වන අතර එය අප මෙතෙක් eudaimonia ලෙස ඉදිරිපත් කර ඇත. එවිට ප්ලේටෝගේ සදාචාරාත්මක චින්තනය ව්‍යුහගත වන්නේ පුළුල් යුඩයිමොනිස්ට් උපකල්පනයකිනි. ඔහුගේ ප්‍රධාන උත්සුකය වන්නේ යහපත්කම ගැන බොහෝ මිනිසුන් දරන අදහස්වලට අභියෝග කිරීමයි, මන්ද ඔවුන් ප්‍රීතිමත් ජීවිතයක් ගත කිරීමට උත්සාහ කිරීමේදී විනාශකාරී ලෙස වැරදියට යන්නේ මෙතැනදීය. බොහෝ අය සිතන්නේ ශීලය සුළු යහපතක් හෝ සතුටින් ජීවත් වීමට බාධාවක් බවයි. ප්ලේටෝ මෙය සම්පූර්ණයෙන්ම වැරදි ලෙස සලකයි. පුද්ගලයින්ට සතුටින් සිටීමට බලාපොරොත්තු විය හැක්කේ ගුණවත් වීමෙන් පමණක් බව ප්ලේටෝ ඉදිරිපත් කරයි. ඒ අනුව මෙම ලිපිය මඟින් ප්ලේටෝ විසින් ඉදිරිපත් කරන ලද ආචාර ධර්ම පිළිබඳ අදහස සාකච්ඡා කරනු ලබයි.

**ප්‍රමුඛ පදඃ** අචාරධර්ම, යුක්තිය, යුතුකම, නෛසර්ගික, සොම්නස

## හැඳින්වීම

ග්‍රීසියේ ඇතැන්ස් නගරයේ ධනවත් පවුලක ඇරිස්ටන්ගේ පුතණුවන් ලෙස ක්‍රි. පූ 428 දී පමණ උපත ලබන ප්ලේටෝ පියාගේ මරණයෙන් පසු මව දෙවැනි විවාහයක් කර ගත්හ. ප්ලේටෝගේ ගුරුවරයා වූයේ සොක්‍රටීස්ය. ඇරිස්ටෝටල් ඔහුගේ ශිෂ්‍යයෙක් විය. තම ගරුවරයා වූ සොක්‍රටීස් පිළිබඳව කුඩා කාල පටන්ම සිතන්නට ඇති නමුත් කුඩා කල සිට සමීප ඇසුරක් තිබූ බවට තොරතුරු වාර්තා නොවේ. එමෙන්ම සොක්‍රටීස් බැලීමට සිර කඳවුරට පවා ගොස් ඇති ප්ලේටෝ සොක්‍රටීස්ගේ මරණය අවස්ථාවේ අසනීපයෙන් සිටි බව සඳහන් වේ. එහෙත් සොක්‍රටීස් ගේ මරණය සිදුවන විට ඔහු විදේශගතව සිටින්නට ඇතැයි සැලකෙන අතර නිරපරාදේ සොක්‍රටීස්ව මරණයට පත්වීමට සැලැස්වීම නිසාම ප්ලේටෝ දර්ශනය කෙරෙහි වඩාත් යොමු වූ බවක් පිළිගැනේ. සංවාදමය ලෙසින් ප්ලේටෝගෙන් ලියැවුණු කෘති සමූහයකි. කාමාව, පෛතගෝරස්, මනෝ ගෝගියාස්, පීඩෝ, සමූහාණ්ඩුව, නිති සහ ඇපලොජී යන කෘතීන් ඒ අතර වේ.

ප්ලේටෝගේ උත්පත්තිය පෙලපසීනියානු යුද්ධයේ මුල් අවදියේ සිද්ධ වූවකි. නිශ්චිතව ම ඔහු ඉපදුන කාලය හා ස්ථානය ගැන තොරතුරු දැනගන්නට නැත. ඇතැන්ස් හෝ ඒජිනාහි ක්‍රි. පූ. 429 සහ 423 අතර උපත ලද යැයි ඓතිහාසික සටහන් අධ්‍යයන කරන නූතන විද්‍යාඥයන් පවසති. පියා පැවත ආවේ කොඩ්රස් නම් ඇතැන්ස් රජ පරම්පරාවෙන් යැයි විවාදයට තුඩු දුන් මතයක් ඇත. ප්ලේටෝගේ මව පෙරික්ටියොනෙ විය. ඇය කිවිඤෙක් හා නීතිවේදියෙකු ලෙසින් නම දැරූ සොලොන්ගේ ඥාති පවුලක් බව කියැවේ. පෙරික්ටියොනෙගේ සහෝදරයා වූයේ චාරමිඩීස් ය. ඇය ක්‍රිටියාස්ගේ ඥාතිදුවක් වූවාය. චාර්මිඩීස් සහ ක්‍රිටියාස් යන දෙදෙනාම ප්‍රජා පීඩකයන් තිස්දෙනා අතර කැපී පෙනුනු චරිත දෙකකි. ප්ලේටෝ හැරෙන්නට ඇරිස්ටන් හා පෙරික්ටියොනෙ යුවලට තවත් දරුවන් තිදෙනෙක් වූහ. පුතුන් දෙදෙනා ඇඩෙයිමැන්ටෙස් සහ ග්ලවුකොන් වෙති. දියණිය පොටොන් නම් වූවාය. පොටොන්ගේ පුතා වූ ස්පිව්සිප්පස්

ප්ලේටෝට පසුව ඔහුගේ ඇකඩමියේ මූලිකයා වූයේය.

ප්ලේටෝගේ පියා ඇරිස්ටන් ප්ලේටෝ කුඩා අවදියේ මිය යන ලදැයි සැලකේ. පෙරික්ටියොනෙ එවිට විවාහ වී ඇත්තේ පිරලිම්පීස් නම් ඇයගේ මවගේ සහෝදරයා සමඟ ය. පිරලිම්පීස් පර්සියන් රාජ්‍යයට යවන ලද තනාපතිවරයෙක් ලෙසින් කිහිපවතාවක් සේවය කරන ලද්දෙක් වූ අතර ඔහු එවක දාර්ශනිකයෙක් වූ පෙරික්ලීස්ගේ මිත්‍රයෙක් ද විය. පෙරික්ලීස් ඇතැන්ස් හි ප්‍රජාතන්ත්‍රවාදී කල්ලියේ නායකයා විය. පිරලිම්පීස්ට ප්‍රථම විවාහයකින් අතිශය රූමත් යැයි සැලකුණු පුතෙක් සිටියේය. ඔහුගේ නම ඩේමුස් විය. පිරලිම්පීස් සහ පෙරික්ටියොනෙගේ විවාහයෙන් පසු උපදින පිරලිම්පීස්ගේ දෙවැනි පුතා ඇන්ටිෆොන් වෙයි.

තරුණ කාලයේ ප්ලෝටෝ ඉගෙන ගන්නට දක්ෂ හා කඩිසර වූ බව සඳහන් ය. ව්‍යාකරණ, සංගීතය හා ජිම්නාස්ටික් වැනි දෑ ඉගෙන ගන්නට ඇත්තේ එවක ගෞරවයට පාත්‍ර වූ ගුරුවරුන් වෙතින් යැයි සැලකේ. පූර්ව සොක්‍රටීස් දාර්ශනිකයෙකු ලෙසින් නම් දැරූ හෙරක්ලයිටස්ගේ සිසුවෙක් වූ ක්‍රැටිලස් වෙතින් හෙරක්ලයිටස්ගේ දර්ශනය ප්ලේටෝ විසින් හැදෑරූ බව කියැවේ.

ඇතැන්ස් නගරය පරාජයට පත්වෙද්දී ප්ලේටෝ තුරුණු වියේ සිටියෙකි. ඔහු දුටුවේ පරාජයට හේතුව ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය ක්‍රමය කියයි. ඔහුගේ රදළ පසුබිම්න් වූ ඉහළ සමාජ තත්වය ද පවුල් සබඳතා ද ප්‍රජාතන්ත්‍රවාදය හෙළා දකින්නට හේතු වූවා යැයි සැලකේ. එසේම ඔහු ඉතා අගය කළ ගුරුවරයා වූ සොක්‍රටීස් ද මරණයට පත් කළේ ප්‍රජාතන්ත්‍රවාදී රජයක් විසින් බැවින් ඔහු තුල ඒ ගැන ද අප්‍රසාදයක් තිබියා යැයි කිව හැකිය. සොක්‍රටීස්ගේ දර්ශනය සටහන්ගත වී ඇත්තේ ප්ලේටෝ අතින් නිසා ඒ සොක්‍රටීස්ගේ අදහස් වෙන්කර ගැනීම දුෂ්කර වූ කාර්යයකි. ඒ අනුව ප්ලේටෝගේ දර්ශනය සඳහා බලපාන ලද පැරණි දාර්ශනික මතවාද කිහිපයක් හඳුනාගත හැකිය.

1. හෙරක්ලිටස්ගේ ප්‍රවාහි දර්ශනය (ප්‍රපංච ලෝකය සැමවිටම වෙනස්වේ)

2. පෛතගෝරස්වාදීන්ගේ සංඛ්‍යා දර්ශනය (ආත්මයන්ගේ අමරණීයත්වය හා ලෝකෝත්තරවාදය)

3. පර්මිනෛඩීස්ගේ දර්ශනය (යථාභූතය, කාලය හා අවකාශය සම්බන්ධ නොවන පිළිගැනීම)

4. ඇනෙක්සිගෝරස්ගේ අභිචිත්තය පිළිබඳ හා සාධ්‍යතාවාදී අදහස

5. විතණ්ඩවාදීන්ගේ නාස්තිකවාදය හා සංශයවාදය

ඇතැන්ස් නගරය කේන්ද්‍ර කරගනිමින් බොහෝ කාලයක් ජීවත් වූ ඔහු එහි ඇකඩමියක් පිහිටුවන ලද එම ආයතනය ප්ලේටෝ ගේ ජීවිතය මෙන්ම පසු පසුකාලීන ඉතිහාසය තුළ ද වැදගත් තොරතුරු රාශියක්ට මුල් වූවකි. ආගමික සමාජයක් වශයෙන් මුලින්ම ආරම්භ කරන ලද මෙය විදේශ සංචාරයන්හි විවිධ ආයතන සහ සමාජ තුළින් ලබාගත් අවබෝධය මත ඇරඹුණු එම ආයතනයේ සාමාජිකයින් සමාජ ජීවිතයම ගත කළවුන්ය. මේ අතර ප්ලේටෝට උරුම වූ නිවසක් අසල දේවාලයක් තනා එය ඔවුන්ගේ මූලස්ථානය කර ගත් බවද සඳහන් වේ. දේශීය මෙන්ම විදේශීය ශිෂ්‍යයන් ද සමූහ වශයෙන් මෙයට පැමිණ ඇති අතර ඇතැන්ස් නුවර ග්‍රීක රාජ්‍යයන්ගේ පිළිගත් පාසල වූයේ ද ප්ලේටෝගේ ඇකඩමියයි. මේ කාලසීමාව වන විට සංස්කෘතියක් ලැබීම මෙන්ම ජීවිතය ක්‍රමයක් පිළිබඳ අදහස දර්ශනය ලෙස සැලකූ නිසා ද මෙබඳු ආයතනයක් පිහිට වන්නට ඇත. මෙම ආයතනයෙන් බිහි වූ ප්‍රබල ශිෂ්‍යයෙකු ලෙස ඇරිස්ටෝටල් පෙන්වාදිය හැකිය. ප්ලේටෝ බටහිර ලෝකයේ වැඩිදුර අධ්‍යාපනයට පිහිට වූ ප්‍රථම ආයතනයේ එනම් ද ඇකඩමිහි පුරෝගාමියා විය. එහි දී ප්ලේටෝ තමන් අතින් ලියැවුන සිය ගුරුවරයා වූ සොක්‍රටීස්ගේ සංවාද ඉගැන්වීය. ප්ලේටෝගේ දර්ශනය කොටස් කිහිපයකින් යුක්ත ය.

ප්ලේටෝ මනෝරාජ්‍යයක් ගැන අදහස් ඉදිරිපත් කළ අතර එසේම සංකල්පවාදය ද ඉදිරිපත් කළේය. අමරණීයත්වයට පක්ෂපාතී තර්කයන් ගෙන විශ්ව සම්භව ශාස්ත්‍රය ගැන අදහස් ඉදිරිපත් කර ඇත. ඔහුගේ විකල්පනය වූයේ ඥානය නම් ප්‍රත්‍යක්ෂ නොව අනුස්මෘතිය යන්නයි.

**පර්යේෂණ ක්‍රමවේදය**

සාහිත්‍ය මූලාශ්‍රය පරිශීලනය කිරීම මගින් තොරතුරු ඒකරාශී කිරීම පර්යේෂණයේ මූලික ක්‍රමවේදය වෙයි. ග්‍රන්ථ සන්ධාර ක්‍රමයට අනුගතව මෙම පර්යේෂණය ප්‍රාථමික මූලාශ්‍රය පරිශීලනය, ද්විතීයික මූලාශ්‍රය පරිශීලනය, සඟරා හා අන්තර්ජාල පරිශීලනය යන ක්‍රමවේදයන් ඔස්සේ සිදුකොට ඇත.

**පර්යේෂණ අරමුණු**

බටහිර දර්ශන ඉතිහාසයේ හමුවන සුවිශේෂී දාර්ශනිකයෙකු වන ප්ලේටෝ විසින් ආචාරධර්ම සංකල්පය පිළිබඳ ඉදිරිපත් කරන මූලික දාර්ශනික අදහස පිළිබඳ විමර්ශනාත්මක විවරණයක් ඉදිරිපත් කිරීම මෙහි මූලික අරමුණ වේ.

**ප්ලේටෝගේ මනෝරාජ්‍යය**

ප්ලේටෝ අතින් ලියැවෙන සංවාද කෘති අතරින් වැදගත් වූවක් සේ සැලකෙන ජනරජය කොටස් තුනකින් සමන්විතය. එහි පළමුවැන්නේ පරමාදර්ශ පොදු රාජ්‍යයක් ගොඩ නැංවීම ගැන සංවාද වෙයි. ඉන්පසුව ලෝකයේ බිහිවෙන දාර්ශනික මනෝරාජ්‍යය සංකල්පයන්හි පටන් ගැන්ම මෙය සේ සැලකේ. ප්ලේටෝ එළඹෙන එක් නිගමනයක් නම් පාලකයා දාර්ශනිකයෙකු විය යුතුය යන්නයි. මෙවැනි අවස්ථාවක පමණක් රාජ්‍යයක් සාමකාමී වන්නේය. රට වැසියා සෞභාග්‍යවත් වන්නේ මෙවැනි පසුබිමකින් රාජ්‍ය ගොඩනැගෙනවා පමණි. ඒ මාර්ගය කුමක්දැයි පැවසීම දාර්ශනිකයාගේ යුතුකමයි. ඒ මාර්ගය සෙවීමට සත්‍ය පිළිබඳ සොයාබැලීම කළ යුතුය. එහි කාණ්ඩ දෙකක් දාර්ශනිකයා

විග්‍රහ කරනු පිණිස ඔහු උපකාරී කර ගනියි. ඊළඟට ජනරජයෙහි අවධානය යොමු වෙන්නේ විවිධ ආණ්ඩු ක්‍රම හා ඒවායේ හොඳ නරක පිළිබඳ සාකච්ඡා වලිනි.

## යුක්ති සංකල්පය

යුක්තිය යන වචනය අර්ථය විමසන ප්ලේටෝ යුක්ති සහගත මිනිසා යන්න විමර්ශනයට වඩා යුක්ති සහගත රාජ්‍යය විමසීම වඩා සුදුසු යැයි සිතයි. ප්ලේටෝ සිය ජනරජය ආරම්භයේ දී ම එහි වැසියන් පංති තුනකට බෙදයි. පොදු ජනයා, යුද භේවායන් සහ ආරක්ෂකයන් යනු එම කොටස් තුනයි. ප්ලේටෝ දේශපාලන බලය දෙන්නේ අවසන් කොටසට පමණි. එසේම ඔහුට අනුව ඒ අවසන් කොටස සෙසු පංති දෙකට වඩා අඩුවෙන් සිටිය යුතු යැයි ද කියයි. ආරක්ෂකයන් සඳහා ඔහු යෝජනා කරන්නේ කුඩා ගෙවල් හා චාම් ආහාර ලබන කුඩා කණ්ඩායමක් ලෙසින් ජීවත්වීමයි. පෞද්ගලික දේපල හා රන් රිදී යනාදිය ඔවුන්ට අහිමිය. ඔවුන්ගේ කැමැත්ත තම පංතියේ සැපත නොව මුළු රාජ්‍යයේ ම යහපත බැවින් ඔවුනට ධනවත් නොවූව ද ප්‍රීතිමත් නොවීමට හේතුවක් නැතැයි ප්ලේටෝ කියයි. යුද භටයන්ට ස්පාර්ටාවේ වැනි හැදියාවක් ඔහු යෝජනා කරයි. ළාබාල දරුවන් යුද වල දී සටන් නොකළත් ඔවුන් සටන් නැරඹිය යුතු යැයි ඔහු පවසයි. ආරක්ෂකයන් විසින් යුද භේවායන් පුහුණු කළ යුත්තේ පොදු සමාජයේ අනිසි ලෙස හැසිරෙන අයව පාලනයටයි. ඒ නිසා යුද භේවායන් ද යම් දුරකට මුදල් භාවිතයෙන් ඈත් වී, දේපල අයිතියෙන් ද අහක් වී කඳවුරක වාසයෙන් කණ්ඩායම් සැදී ආහාර ගනිමින් ජීවත් විය යුතුය. සෑම දරුවෙකුට ම අධ්‍යාපනය අනිවාර්ය කරන ප්ලේටෝ එක හා සමාන වූ අධ්‍යාපනයක් ගැහැණු පිරිමි දෙපිරිසට ම නිර්දේශ කරයි. සංගීතය, ශාරීරික අභ්‍යාසයන් හා යුද ශිල්පය ද සුදුසු යැයි කියයි. සෑම අතකින් ම ස්ත්‍රීන් හා පුරුෂයන් සම්පූර්ණ සමාන තත්වයක් ලැබීම ඔහු අනුමත කරයි. එසේම ජනරජයේ නීති සම්පාදකයා වැසියන් අතරින් ආරක්ෂකයන් හා යුද භේවායන් තෝරා ගැනීමෙන් පසුව ඔවුන් පොදු නිවාස, පොදු භෝජන හි නිරත වෙද්දී සංවාසය

පිණිස ද කිසිවෙකුට තනි අයිතියක් නොලැබේ යැයි ඔහු පවසයි. සංවාසය සඳහා ඉඩ ලැබෙන්නේ පාලකයන් විසින් තීරණය කරන අන්දමට ය. අංග විකල දරුවන්ව රහසිගතව කිසිවෙකු නොදන්නා තැනක දමන්නට ද ඔහු යෝජනා කළේය. මව්වරු වයස විස්ස හා හතළිහ අතරත් පියවරු වයස විසිපහ හා පනස් පහත් අතර විය යුතු බව කියූ ප්ලේටෝ ඒ වයස් සීමාවලින් බැහැරව සංවාසය තහනම් නැති නමුත් එයින් උපදින දරුවන්ට ගබ්සාව හා බාල ඝාතනය පවා නිර්දේශ කළේය. දාර්ශනික රජු හොඳ හා නරක අතර වෙනස දන්නා හෙයින් ඔහු යහපත් පාලකයෙක් වේ යැයි ප්ලේටෝ කීය.

පරම රාජ්‍යයක පොදු වැසියන්ට සරල සංගීත වාදනයට ඉඩ දුන්න ද, දේශප්‍රේමී ගීත ගයන්නට ඉඩ දුන්න ද, කලාකරුවන් වැඩි කොටස රටින් පිටුවහල් කළ යුතු යැයි ඔහු නිර්දේශ කළේය. ඒ හේතු හතරක් නිසාය. පළමුවැන්න, කලාව යනු අනුකරණයක අනුකරණයකි. දෙවැන්න, කලාකරුවා කිසිත් නොදැන තමන් දන්නා බව හඟවන්නෙකි. තුන්වැන්න, පවිත්‍ර වූ තථ්‍යාතවය නොදකින්නට සංවේදයන් හසුරුවන කලා කෘති මිනිසාව රැවටීමකි. හතරවැන්න, කලා නිර්මාණ යනු එක්කෝ අනුරාගී වූවකි නැත්නම් ප්‍රචණ්ඩත්වයෙන් යුතු වූවකි. ඒ නිසා එයින් අරාජිකත්වයට මාර්ගය නිර්මාණය වේ. ප්ලේටෝට අනුව හෝමර් පවා වාරණයට ලක්විය යුතුයි.

**ආචාර ධර්ම සංකල්පය**

ප්ලේටෝගේ මුල්කාලීන කෘතිවල වැඩි වශයෙන් ආචාර ධර්ම සංකල්පය පිළිබඳව සංවාදයක් මතුවන අතර පසුකාලීනව තර්ක ශාස්ත්‍රය, අධිභෞතික වාදය යන විෂයන්වලට අඬංගු විස්තරයක් වැඩි වශයෙන් ඇතුළත් වූ අතර ආචාර ධර්මයත්, අධිභෞතික වාදයත්, ඥාන විභාගයක් යන විෂයන් එකම කෘතියේ ඉදිරිපත් කරයි. ප්ලේටෝ තම ආචාරධර්ම ඉදිරිපත් කිරීමේ දී එවකට ග්‍රීසියේ පැවති සදාචාර සංකල්පය විවේචනයයට ලක් කරමින් සහ එම සංකල්පවලට නව අර්ථකථන ලබාදීමට කටයුතු

කරයි. ඒ ආකාරයට තේරුම් ගත යුතු යැයි පෙන්වාදෙන ප්‍රධාන සදාචාර සංකල්ප සතරවන බුද්ධිය, ප්‍රඥාව, ධෛර්ය හා සංයමය ප්ලේටෝගේ බොහෝ ආචාර ද සංකල්පවල අඩංගු අතර ඒවායේ මෙම සාම්ප්‍රදායික සංකල්ප මනාව විස්තර වෙයි. යුක්තිය පිළිබඳ එවකට තිබූ එක් නිර්වචනයක් නම් 'සත්‍ය ප්‍රකාශ සහ ආපසු දෙන පොරොන්දු මත තමන් ලබාගත් දෙයක් ආපසු දීම යුක්තිය' යන්නයි. ප්ලේටෝ මෙම අදහස විවේචනයට ලක්කර සැම විටම සත්‍ය ප්‍රකාශ කිරීමට හැකිදැයි ප්‍රශ්න කරයි. සැම තැන්හිම සත්‍ය ප්‍රකාශ කිරීමට නොහැකි වන අතර එමෙන්ම සැමවිටම ගත් දෙය ආපසු දිය නොහැකිය. ගත් දෙය ආපසු දීම යුක්තිය නම් තමා තබාගත් ආයුධයක් මානසික ආබාධයකින් යුත් පුද්ගලයෙකුට එය ඉල්ලන විට ලබාදීම සියදිවි හානිකර ගැනීමට උදව් කිරීමක් වන බව ඔහුගේ අදහසයි. යුක්තිය යනු මිතුරාට යහපතක් කිරීමත් සතුරාට අයහපතක් කිරීම යන ග්‍රීක අදහස ප්‍රතික්ෂේප කරන ප්ලේටෝට අනුව සතුරාට අයහපතක් මිස යහපතක් කළ හැකි අවස්ථාවක එනම් යුද්ධයක් නොමැති විට යුක්තිය අවශ්‍යදැයි ප්‍රශ්න කරයි. ගනුදෙනුවල දී යුක්ති අවශ්‍ය බව මෙහිදී පෙන්වා නොයෙක් ආකාර ගනුදෙනු විමර්ශනයට ලක්කර ඇත.

යුක්ති සහගත මිනිසා අවශ්‍ය වන්නේ යමක් රැකගැනීමටදැයි ප්ලේටෝ ප්‍රශ්න කරන අතර හොඳින් පහරදීම කළ හැකි තැනැත්තාට පහරදීම වැළැක්වීම ද කළ හැකිය. රෝග වැළැක්විය හැකි තැනැත්තාට රෝග බෝ කිරීම ද කළ හැකිය. ප්ලේටෝ මෙයින් පැහැදිලි කරන්නේ යුක්ති සහගත මිනිසා යමක් රැකගැනීමට අවශ්‍ය විශ්වාසවන්ත අයෙකු නොවන බවයි. යුක්තිය යනු බලවතා මත ක්‍රියාත්මක වන්නක් බව ඔහු ප්‍රකාශ කරයි. සමාජයේ බලවතා රජය වන අතර යුක්තිය ඇත්තේ රජයේ ප්‍රයෝජනය පිණිසය. රජයේ අරමුණ යටත්වැසියන්ගේ සුභසාධනයයි. ඒ අනුව යුක්තිය ක්‍රියාත්මක වන්නේ රජයේ ප්‍රයෝජනය පිණිස නොව යටත් වැසියාගේ ප්‍රයෝජනය පිණිසය. මේ පිළිබඳ ප්‍රතිප්‍රශ්න නගන ප්ලේටෝ දක්වන්නේ රජය වැසියන් පෝෂණය කරන්නේ රජයේ යහපතට මිස මහ ජනයාගේ යහපතට නොවේ. යන්නයි.

ප්ලේටෝගේ තවත් අදහසක් වූයේ අයුක්තියට වඩා යුක්තිය හොඳය යන්නයි. අයුක්ති සහගත මිනිසා සැපවත් ජීවිතයක් ගත කරන අතර යුක්ති සහගත මිනිසා අපක්ෂපාතීව ක්‍රියා කරන බැවින් ඔහුට වාසි ලැබෙන අන්දමට ක්‍රියා නොකරයි යන්නයි. එමෙන්ම යහපත වෙනුවෙන් යුක්ති සහගතව කටයුතු කරන බැවින් දුප්පත් වන බව ද නෑයන් ඔහු හා සම්බන්ධතා නොපවතින බව ද සිදුවෙයි. එයින් ඔහු සළුත කරනුයේ යුක්තියට වඩා අයුක්තිය හොඳ බවයි. යුක්තිය ක්‍රියාත්මක වන්නේ එයින් ලැබෙන සමාජ ගෞරවය මතය යන්න ඔහුගේ තවත් අදහසකි. මෙයට අනුව නෛසර්ගික යුක්තියේ වටිනාකමක් නැත.

මේ ආකාරයට එවක සමාජයේ යුක්තිය පිළිබඳ පැවති විවිධ මත සාකච්ඡාවට ලක්කරන ප්ලේටෝ එම මත සියල්ල ඛණ්ඩනය කරන අතර ඒ සඳහා ඉදිරිපත් කරන ප්‍රතිතර්ක තර්කයන්ට පමණක් සීමා වී ඇත. එවා යථාර්ථවාදී නොවේ. යුක්තිය සමාජයේ අවශ්‍යයෙන්ම තිබිය යුතු සහ ක්‍රියාත්මක විය යුතු දෙයක් ලෙසත් සමාජයේ එක්ව ජීවත්වීමට යුක්තිය අවශ්‍ය දෙයක් බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරයි.

ප්ලේටෝගේ අදහස නම් යුක්තිය නෛසර්ගිකවම එයට අදාළ වටිනාකමක් ඇති දෙයක් ලෙස පෙන්වාදීමය. මෙහිදී ප්‍රඥාව, ධෛර්ය, හා සංයමය යන සාධකයන්ගේ එකතුව ගෙන ඒවා ක්‍රියාත්මක කිරීමට යුක්තියේ ඇති අවශ්‍යතාව පෙන්වාදෙයි. යුක්තිය නොමැති තැන මෙම සාධක තුන අඩපණ වන බවත් මෙය රාජ්‍යය හා පුද්ගලයා සාදෘශ්‍ය කරගෙන පවතින බවත් පෙන්වාදෙයි. ප්ලේටෝ රාජ්‍යය කොටස් තුනකට බෙදා දක්වයි. එනම් පාලක පක්ෂය, ආරක්ෂක පක්ෂය හා කම්කරු පක්ෂය වශයෙනි. එහිදී පාලක පක්ෂයට ප්‍රඥාවත් ආරක්ෂක පක්ෂයට ධෛර්යත් කම්කරු පක්ෂයට සංයමයත් පැවතිය යුතු බව ඔහු අවධාරණය කරයි. පාලක පක්ෂයේ කාර්යය පාලනය වන අතර ආරක්ෂක පක්ෂයේ කාර්යය රාජ්‍යය ආරක්ෂා කිරීමයි. කම්කරු පක්ෂයේ කාර්යය රජයේ නිෂ්පාදන කටයුතුවල යෙදීමය. මෙම ත්‍රිවිධ පාර්ශවයන්ට අයත් කාර්යය පමණක් ඉටු කිරීම රාජ්‍යයේ

යුක්තිය වන බවත් එසේ නොමැතිව පාලනයට නිපුණත්වයක් නැති කම්කරුවන් පාලන කටයුතුවලට සහභාගී වීමෙන් පාලනය ගැටලු සහගත වන බව ප්ලේටෝ දක්වයි. මෙම අංශ ත්‍රිත්වය සමගිව තම තමන්ගේ කටයුතු පමණක් කිරීම රාජ්‍ය යුක්තියයි. එමෙන්ම එය සමාජ යුක්තිය ද වේ. පුද්ගලයා තුළ යුක්තිය ක්‍රියාත්මක වීමේ දී ආත්මය රාජ්‍ය මෙන් කොටස් තුනකට බෙදා දක්වයි. එනම් බුද්ධිය, වීර්යය, රුචිය වශයෙනි. බුද්ධිය මගින් ප්‍රඥාවත් වීර්යය මගින් ධෛර්යත් රුචිය මගින් සංයමයත් ක්‍රියාත්මක කළ යුතුය. මෙම ත්‍රිවිධ සාධකයකයන්ගේ මනා ක්‍රියාකාරීත්වය ආත්මයේ යුක්තියයි. මෙයින් ප්ලේටෝ පැහැදිලි කරනුයේ යුක්තිය අනිකුත් සත්ගුණයන්ගේ ක්‍රියාකාරීත්වය අවශ්‍ය සාධකයක් ලෙස පෙන්වාදෙයි.

ප්ලේටෝ දක්වන පරිදි සමාජයේ ජීවත්වන පුද්ගලයාගේ යුක්තිය වන්නේ තම සමාජ කාර්ය නිසිපරිදි ඉටු කිරීමය. සමාජ පන්තිවල කාර්යභාරය වන්නේ ද එයම ය. මෙය ක්‍රියාත්මක කළ හැක්කේ පුද්ගලයා තුළ ප්‍රඥාවත්, ධෛර්යත්, සංයමයත් තුලනාත්මකව පාලනය කිරීමෙනි. මෙම ත්‍රිවිධ සාධකයන්ගේ තුලනය යුක්තිය ලෙස ප්ලේටෝ ඉදිරිපත් කරයි. මෙම ත්‍රිවිධ සාධක ආත්මයේ නොමැති විට පුද්ගලයා තුළ ගැටීම නිසා ඔහු තුළ අයුක්තිය ඇතිවේ. එමෙන්ම පාලක පක්ෂය නියෝජනය කරන පිරිස තුළ ප්‍රඥාවත් ආරක්ෂක අංශය නියෝජනය කරන පිරිස තුළ ධෛර්යත්, කම්කරු පක්ෂය නියෝජනය කරන පිරිස් තුළ සංයමයත් එකිනෙක ගැටීමෙන් ද අයුක්තිය ඇතිවන බව ප්ලේටෝ දක්වයි. මෙයින් ඔහු අදහස් කරන්නේ පුද්ගලයා තුළ මෙම කාර්යන් සමාජය තුළ නිසි පරිදි ඉටුවීමට නම් පුද්ගලයා යුක්ති සහගතව ජීවත්විය යුතු බවයි.

ප්ලේටෝ දක්වන පරිදි සංයමය පුද්ගලයා තුළ අත්‍යවශ්‍යයෙන්ම ක්‍රියාත්මක විය යුතු අංගයක් ලෙස දක්වයි. එමෙන්ම ග්‍රීක සමාජය තුළ මෙය පිරිමි පක්ෂයට වඩා කාන්තා පක්ෂයේ ගුණයක් ලෙස සලකා ඇත. රුචිය පාලනය කිරීම සංයමය ලෙස ඔහු ඉදිරිපත් කරයි. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය

ප්‍රතික්ෂේප කරන ප්ලේටෝ දක්වන්නේ එය සංයමයක් නොමැති රුචියට ඉඩදෙන පාලනයක් ලෙසිනි. සංයමය ක්‍රියාත්මක කිරීමෙන් පුද්ගලයා තමාගේම ස්වාමියා වන අතර තමා තමාගේම ස්වාමියා යැයි කීම පුදුම උපදවන්නකි. තමා තමාගේ ස්වාමියා නම් තමාට කිසිදු විසඳුමක් නොමැතිව තමාටම යටත්වේ. සෑම පුද්ගල චරිතයකම යහපත් හා අයහපත් යනුවෙන් මූල ද්‍රව්‍යයන් දෙකක් පවතින අතර යහපත් මූල ද්‍රව්‍ය මගින් අයහපත් මූල ද්‍රව්‍ය පාලනය කරන්නේ නම් තමා තමාගේම ස්වාමියා වෙයි. එවැනි තත්වයක් ඇති පුද්ගලයා සංයමයකින් යුක්ත වන අතර පුද්ගලයා පරම සංයමයකින් යුත් තැනැත්තෙකු වන්නේ දාර්ශනිකයෙකු වූ දිනකය. නරක ආශ්‍රයත් නරක හැදියාවත් නිසා පුද්ගලයෙකු අසංයම වන අතර එවැනි පුද්ගලයෙකු තුළ නීතිය හා යුක්තිය පිළිබඳ නම්‍යශීලී භාවයක් නොමැත.

සංයමය ඇති කරගැනීමට පුද්ගලයා තුළ ධෛර්යය තිබිය යුතුය. මෙම ධෛර්ය ප්‍රඥාව මගින් පාලනය කළ යුතුය. රුචියට අවශ්‍ය ආකාරයට පුද්ගලයා පාලනය වීමෙන් අසංයම බවට පත්වන ආකාරය පැහැදිලි කරන ප්ලේටෝ දක්වන්නේ ආහාර පිළිබඳ ඇති අධික තෘප්තිය පාලනය නොකිරීමෙන් රෝගී බව ඒකාන්ත වන බවත් මෙවැනි තත්වයක් ඇති නොවීම සඳහා පුද්ගලයා ප්‍රඥාව මෙහෙය විය යුතු බවත් ය. ප්ලේටෝගේ දර්ශනයට අනුව මෙම සත්ගුණ සමව ක්‍රියාකිරීමෙන් යහපත සිදුවන බවත් ඒවා එකිනෙකට එකක් සම්බන්ධ බවත් එක සත්ගුණයක් අනිකට වඩා යහපත් යැයි කිව නොහැකි බවත්ය. ඒ අනුව ප්‍රඥාව, ධෛර්ය හා සංයමය පුද්ගල චරිතයේ ක්‍රියාත්මක වන ආකාරය අනුව යුක්තිය ක්‍රියාත්මක වේ.

ප්ලේටෝ ඉදිරිපත් කරන තවත් සංකල්පයක් වනුයේ සොම්නසයි. එම සොම්නස ප්‍රඥාව කේන්ද්‍ර කරගෙන ඇති වූවක් ලෙස දක්වයි. මිනිස් ජීවිතය අවශ්‍යතා තුනක් මත රඳා පවතින අතර එනම් කෑම, බීම හා ලිංගික තෘප්තිය, මේ අතරින් වඩාත් බලවත් වනුයේ ලිංගික තෘප්තියයි. ඒ අතරින් ප්ලේටෝ දක්වනුයේ කායික තෘප්තිය විඳිය යුතු බවයි. එනම් කය තෘප්තිමත් කළ යුතුය

යන්නයි. පුද්ගලයාගේ බුද්ධියට කය බලපාන බැවින් බුද්ධිමත් තීරණගත හැකි වනුයේ කුසගින්න සංසිඳුවීමෙන් පසුව ය. මෙයින් ප්ලේටෝ පැහැදිලි කරනුයේ කායික සොම්නස තෘප්තිමත් කළ යුතු බවයි. එහෙත් එය බුද්ධිමත්ව කළ යුත්තක් ලෙසත් බුද්ධියෙන් ලබන තෘප්තිය ලෝක ස්වභාවය අනුව ලබන්නක් ලෙසත් දක්වයි.

සොම්නස යන්න පැහැදිලි කරන ප්ලේටෝ සමහර සොම්නස ස්වභවයෙන්ම දුසිරිත් බවත් ඇතැම් සොම්නස් ස්වභාවයෙන්ම යහපත් බවත් සමහර සොම්නස් සීමිතව තෘප්තිමත් කළ යුතු බවත් දක්වයි. අධික සොමනස ප්‍රතික්ෂේප කරන ප්ලේටෝ පෙන්වාදෙන්නේ අධික ලෙස සොම්නස විඳීමට යෑමෙන් වේදනාවක් ඇතිවන බවයි. පුද්ගලයාට සොම්නස දෙන ධනය වැනි භෞතික දේ පිළිබඳව අදහස් දක්වන ප්ලේටෝ පෙන්වාදෙනුයේ එය යහපත් වනුයේ යහපත් චරිතයක් හා බුද්ධියක් ඇති මිනිසාට ය. අයහපත් මිනිසා වෙත ඇති සොම්නස ඉතා දරුණුය. සොම්නස් සහගත ධනය යහපත් අරමුණකට යොමු කළ හැක්කේ බුද්ධියත් යහපත් චරිතයත් ඇති පුද්ගලයාටය. යහපත් චරිතයක් ඇති ප්‍රඥාව මගින් මෙහෙයවන පුද්ගලයෙකු නිර්මාණය කළ හැක්කේ අධ්‍යාපනයෙන් බවත් පුද්ගල චරිතයේ සංයමයත් ප්‍රඥාවත් ධෛර්යත් යුක්තියත් ක්‍රියාත්මක වන ආකාරයට අධ්‍යාපනය දිය යුතුය. අධ්‍යාපනය සම්පූර්ණයෙන්ම රාජ්‍ය මගින් ක්‍රියාත්මක කළ යුතු බවත් පුද්ගල හැකියාවන්ට අනුව එය ලබාදිය යුතු බවත් ප්ලේටෝගේ අදහස විය. පුද්ගල චරිත සංවර්ධනයේ දී මුල් කාලයේ දී ලබන අත්දැකීම් චරිත සංවර්ධනයට බලපාන බවත් ඒ අනුව ළමා අධ්‍යාපනය සැලසුම් සහගතව ක්‍රියාත්මක කළයුතු බවත් දක්වයි.

ග්‍රීසියේ එවකට පැවති සදාචාරය සංකල්පය ඇසුරින් සදාචාරය විග්‍රහකරන ප්ලේටෝගේ අදහස වූයේ සදාචාරය කාලයට අනුව සකස් කිරීමය. එහිදී ග්‍රීසියේ අධ්‍යාපන ක්‍රමය තුළ ළමුන්ට ඉගැන්වූ මනඃකල්පිත කතා, සාහිත්‍ය, නිසා ළමුන්ගේ ධෛර්ය නැතිවී යන බවත් දෙවියන් නිරූපනය කිරීමෙන් හීන පුද්ගයන් නිර්මාණය වන බවත් මෙම සාහිත්‍ය කතා ළමුන්ට

ඉගැන්වීමෙන් හා ඒවා කියවීමෙන් ළමුන් නොමගට යන බව ප්ලේටෝ දක්වයි. දෙවියන් සම්බන්ධව තිබෙන මෙම කතන්දර නිසා සමාජයේ අයුක්තිය ක්‍රියාත්මක කිරීමට පිටුවහලක් ලැබෙයි. ඒ අනුව පුද්ගලයන් වැරදි සිදුකොට ඒවා වසා ගැනීමට ඔවුන් එවැනි දෙවියන් සම්බන්ධ අදහස් දක්වයි. එයින් පැහැදිලි වනුයේ ඔවුන් ක්‍රියා කරන්නේ ඔවුන්ගේ කැමැත්තට අනුව නොව දෙවියන්ගේ කැමැත්තට අනුව බවයි. බොහෝ කාව්‍ය ග්‍රන්ථවල යුක්ති ගරුක මිනිසා වේදනාවෙන් පීඩාවිඳින බව ස්ඵුට කිරීමෙන් අයුක්තිය කිරීමට අනුබල දීමක් හා යුක්තියට අනුව ක්‍රියා කිරීමට බාධාවකුත් සිදු කරයි.

එවකට ග්‍රීසියේ පැවති සාහිත්‍යය දැඩි ලෙස ප්‍රතිසංස්කරණවලට ලක්විය යුතු බව ප්ලේටෝගේ අදහස විය. නාට්‍ය යනු විවිධ රඟපෑම් සහිත සිද්ධි සමුදායකි. එනම් චරිත අභිනය කොට රඟ දැක්වීමෙන් ඒවා තම චරිතයට බලපාන බව ප්ලේටෝ ගේ අදහස විය. ඒ අනුව තරුණයින්ට මහලු අයට කාන්තාවන්ට රඟපෑමට ඉඩ නොදිය යුතු බව දක්වන ප්ලේටෝ ගේ අදහස වනුයේ රඟපෑමෙන් ඔවුන්ට තමන් රඟපාන චරිතයන්ගේ ගති ගුණ බලපාන බවයි. එම නිසා සාහිත්‍ය කෘතියක හෝ නාට්‍යයක අගය මනින්නේ එම කෘතියෙන් සදාචාරයට ලැබෙන පිටුවහල අනුව යන්න ප්ලේටෝගේ අදහස විය. එතුළින් ස්ඵුට කරනුයේ සාහිත්‍යය සදාචාරය වර්ධනය කිරීම පිණිස නිර්මාණය කළ යුතු බවයි. පුද්ගලයාගේ චරිතය හැඩගැසීම සංයමයකින් යුක්ත සාහිත්‍යයක් යෝජනා කරයි. පුද්ගලයා තුළ ඇති චිත්තවේග යන් ඇවිස්සෙන අධ්‍යාපනයකින් ඔහුව නරකට යොමු කරන බව ඔහුගේ අදහස විය. ඒ අනුව භාව විරේචනය වැරදි දෙයක් ලෙස ඉදිරිපත් කරන අතර සංයමයත්, ධෛර්යයත්, ප්‍රඥාවත්, යුක්තියත් මගින් භාවයන් පාලනය කළ යුතු බව ප්ලේටෝගේ මතය විය. පරිසරය අනුව චරිතය හැඩගැසෙන අතර ළමයාට අවට ඇති පරිසරය සදාචාරාත්මක එකක් විය යුතු බව ඔහුගේ අදහස විය.

කායික සෞඛ්‍යය ගැන ප්ලේටෝ ඉදිරිපත් කරන අදහස් අනුව යහපත් ජීවිතයක් ගත කිරීමට නැණවත් මනසක් මෙන්ම

නීරෝගීමත් කයක් ද පැවතීම අවශ්‍ය ය. එහෙත් මෙම කායික සෞඛ්‍යය කෙසේ ඇති කරගත යුත්තේ ද යන්නට මතභේද පවතී. ප්ලේටෝ එවකට තිබූ කායික අධ්‍යාපනය විවේචනය කරන කායික අභ්‍යාස කාරවල පුහුණුවන පුරුෂයින්ගේ සෞඛ්‍ය ඉතාමත් මෘදු වේ. විසිතුරු සංගීතය නිසා පුද්ගලයා තුළ අසංයමය ඇති වන්නාක් මෙන් සුඛෝපභෝගී ආහාර නිසා ශරීරය රෝගී වේ. රෝගී ශරීරයට අසංයමයට යොමුවේ. කායික අධ්‍යාපනය යුද්ධ භටයෙකුට උපයෝගි වන ලෙස මෙයින් පෙන්වාදෙන අතර එයින් අදහස් කරනුයේ කායික අධ්‍යාපනය කායික දුෂ්කරතා වලට ඔරොත්තු දෙන එකක් විය යුතුය. මිනිසෙකුට රෝගී ව ජීවත්වීමට නොහැකිය. ඔහු විසින් කළ යුතු කාර්යයක් ඇත. ප්ලේටෝගේ අදහස පුද්ගලයා ක්‍රියාශීලී අයෙකු විය යුතු බවයි. ක්‍රියාශීලී නොවන පුද්ගලයන්ගෙන් සමාජයට බරක් මිස යහපතක් ඇති නොවන අතර පුද්ගලයා සමාජයට සෙතක් විය යුතුය. ප්ලේටෝගේ මතය කායික හා මානසික සෞඛ්‍ය අධ්‍යාපනයේ පරමාර්ථය විය යුතු බවත් එය සමබර වූ විට පුද්ගල ජීවිතය සාර්ථක වන බවයි.

සදාචාර සම්පන්න ජීවිතයක් ගත කිරීමේ සහ පළමු පියවර මානසික අධ්‍යාපනය හා කායික අධ්‍යාපනයයි. එහෙත් අවබෝධවත් සදාචාර ජීවිතයක් ගත කිරීමට නම් ලෝක ස්වභාවය උගත යුතුය. ලෝක ස්වභාවය පුද්ගලයා දර්ශනය තුළින් ඉගෙනගනී. ප්ලේටෝට අනුව දර්ශනය ජීවමය දෙයකි. න්‍යායාත්මක දෙයක් නෙවෙයි දර්ශනය මගින් මිනිසාට පරමාදර්ශී නීතිය පිළිබඳව අවබෝධයක් ලැබීමටත් ලෝක ස්වභාවය අවබෝධ කරගැනීමටත් හැකියාව ලැබේ. මෙම අවබෝධය සදාචාර ජීවිතයක් සකස් කර ගැනීමට උපකාර වේ. ප්ලේටෝට අනුව ලෝකයේ සදාචාර නීතියක් ක්‍රියාත්මක වන බවත් එමගින් යහපත් පුද්ගලයාට සොම්නසකුත් අයහපත් පුද්ගලයාට වේදනාවකුත් ගෙන දෙන බව දක්වයි.

ආචාර ධර්මවලදී මිනිසාට නොමැරෙන ආත්මයක් ඇති බව ප්ලේටෝ ඉදිරිපත් කරයි. මිනිසාගේ මරණයෙන් පසු ඔහුගේ ආත්මය නැවත උපදින බව ඔහු පිළිගනියි. මිනිසාගේ කැමැත්ත

අනුව ක්‍රියා කිරීමේ දී ශක්තියක් හෙවත් ස්වච්ඡන්දතාවයක් මිනිසාට ඇති බව ඔහු පිළිගනියි. එයින් ඔහු පුද්ගල වගකීම පුද්ගලයා වෙත පවරයි. මිනිසාගේ ප්‍රීතයට හෝ දුකට හේතුව මිනිසා වන අතර මෙලොව ජීවිතය පමණක් නොව පරලොව ජීවිතය ද මිනිසා විසින් සකස් කරගත යුතුය. එමෙන්ම පුද්ගලයාගේ ආර්ථික හේතූන් ද පුද්ගලයාගේ සදාචාරයට බලපාන බව ද ප්ලේටෝ දක්වයි. පුද්ගලයාට දැඩි ලෙස ධනය ලැබීම සදාචාර විනාශයට හේතුවක් ලෙස ඉදිරිපත් කරන අතර ධනය සමබරව ක්‍රියාත්මක විය යුතුය යන්න ඔහු පැහැදිලි කරයි. ප්ලේටෝගේ සදාචාරය පිළිබඳ ඉගැන්වීම පිළිබඳ අදහස් දක්වන බර්ට්‍රන්ඩ් රසල්ගේ අදහස වනුයේ

"අයුක්තියෙන් තොර ව බලතල හා වරප්‍රසාද පිළිබඳ අසමානතා පැවතීමට ඉන් ඉඩ ලැබේ. ආරක්ෂකයාට සියලු බලතල ලැබේ. සමාජයේ සිටින ඉතාම ඥානවන්ත කොටස ඔවුන් බැවින් එය එසේ සිදු වේ."

ප්ලේටෝ ගේ නිර්වචනය අනුව අයුක්තිය ඇති වනුයේ ඇතැම් ආරක්ෂකයන්ට වැඩියෙන් ඥානවන්ත වූවන් සෙසු පන්තිවල සිටිය හොත් පමණි. උත්පත්තිය හා අධ්‍යාපනය යන ද්විත්ව ලාභය නිසා, බහුතර වශයෙන්, ආරක්ෂකයන් ගේ දූ දරුවන් අනෙකුත් අයගේ දූ දරුවන්ට වැඩියෙන් උසස් වනු ඇතැයි සිතමින් ම, ප්ලේටෝ රට වාසීන් උසස් කිරීමටත් පහතට හෙළීමටත් ඉඩ සලසා ඇත්තේ එබැවිනි. තව ද, දේශපාලකයෙකු තමාගේ සමාර්ථය තමාගේ ම නැතහොත් තම පන්තියේ, පක්ෂයේ හෝ ඇදහීම් හෝ යහපතට වැඩියෙන්, පොදු යහපත පිණිස යොදතැයි යන්න කිසිසේත් නිශ්චය කළ නොහැක.

යුක්තිය, පිළිබඳ ප්ලේටෝ ගේ නිර්වචනය සම්ප්‍රදායික සැලැස්ම උඩ සංවිධානය කරන ලද්දා වූ, නැතහොත් තමා ගේ රාජ්‍යය පිළිබඳව, සමස්ථ වශයෙන් කිසියම් ආචාර ධර්ම පරමාදර්ශයක් සාක්ෂාත් කර ගැනීම පිණිස සංවිධානය කරන ලද්දා වූ රාජ්‍යයක පැවැත්ම කල්පනාවට නංවයි. යුක්තිය නම්

සෑම කෙනෙකු ම තමාට අයත් කාර්යය ඉටු කිරීම යැයි ප්ලේටෝ පවසන ලදී. මිනිසා ගේ කාර්යය කුමක්ද යන්න නිර්ණය කිරීමේ දී, ආණ්ඩු වේ පරමාර්ථය අත්‍යාවශ්‍යය. පාලකයන් සැවොම දාර්ශනිකයන් විය යුතු නමුත්, නව නීති ආදියට ඉඩ නැත. දාර්ශනිකයකු වූ කලී සෑම කල්හි දී ම ප්ලේටෝ අවබෝධ කර ගෙන ඔහු හා එකඟ වන පුද්ගලයකු විය යුත්තේ ය.

ප්ලේටෝ දර්ශනය සැලකුවේ එක් ආකාරයක දෘෂ්ටියක් වශයෙනි. එනම් සත්‍යයේ දෘෂ්ටිය. වශයෙනි. එය වූ කලී ප්‍රඥාවට ඇති ප්‍රේමය යි. ප්ලේටෝ ජනරජය (REPUBLIC) කෘතිය ලියන කල්හි තමා සම්පූර්ණයෙන් ම විශ්වාසය කළ දෘෂ්ටියේ ස්වභාව අන්‍යයනට වටහා දීම උදෙසා දෘෂ්ටාන්තයක් එනම්, ගුහාවේ දෘෂ්ටාන්තයේ ආධාරය අවශ්‍ය විය. එහෙත්, ඔහු එයට බසිනුයේ, සංකල්ප ලෝකයේ අවශ්‍යතාව දැකීමට පාඨකයන් යොමු කරවීමේ පරමාර්ථයෙන් කරන ලද විවිධ ප්‍රාරම්භ සාකච්ඡා වලින් පසුව ය.

ප්ලේටෝගේ දර්ශනයෙහි යහපතට ඇත්තේ විශේෂ තත්ත්වයකි. විද්‍යාව හා සත්‍යය යහපත බඳුය. එහෙත්, වඩා උසස් තැනක් යහපතට අයත් යැයි ඔහු කියයි. යහපත සාරය නොවේ. ගුණය හා බලය අතින් එය අතිශයින්ම සාරය ඉක්මවා සිටී. අපෝහකය, පරම යහපතේ සංජානයෙන් බුද්ධි විෂයක ලෝකයේ කෙළවර කරා මඟ පෙන්වයි. ගණිත විද්‍යාඥයාගේ උපන්‍යාසය බැහැර කිරීමට අපෝහකයට පිළිවන් වූයේ යහපත මගිනි.

ප්ලේටෝ ගේ සංකල්ප සිද්ධාන්තයෙහි පැහැදිලි ලෙසම දෝෂ කිහිපයක් අන්තර්ගත ය. එහෙත් මේ කෙසේ වෙතත් දර්ශනයේ ඉතා වැදගත් ඉදිරි ගමනක් ඉන් ප්‍රකාශ වේ. එය එසේ වනුයේ විවිධ ආකෘතිවලින් අද දක්වා ම නොනැසී පවත්නා සාමාන්‍යයන් පිළිබඳ ගැටලුව අවධාරණයෙන් පවසන ප්‍රථම සිද්ධාන්තය එය බැවිනි. ප්‍රීඩෝ (PHEADO) නමින් හඳුන්වනු ලබන සංවාදය කිහිප ආකාරයකින් සිත් ගන්නා සුළුය. එහි අභිප්‍රාය වශයෙන් ඇත්තේ සොක්‍රටීස්ගේ ජීවිතයෙහි අවසාන මොහොත විස්තර කිරීමය. එනම්, හෙම්ලොක් විෂ බඳුන පානයට

මොහොතකට පෙර හා පසුව ඔහු ගේ සිහිය නැති වී ගිය මොහොත දක්වා ඔහු කළ කථාව ය. උපරිම ප්‍රමාණයට යහපත් හා ප්‍රඥාවන්ත වූ ද, මරණ බිය බිඳකුදු නැත්තා වූ ද, මිනිසකු පිළිබඳ ප්ලේටෝ ගේ පරමාදර්ශය මෙයින් ඉදිරිපත් කෙරෙයි. ප්ලේටෝ ඉදිරිපත් කරන පරිදි මරණාභිමුඛ වූ සොක්‍රටීස්, අතීත වර්තමාන කාලද්වයෙහි ම ආචාර ධර්මානුකූලව වැදගත් ය. ක්‍රිස්තුස් වහන්සේ දුක්ඛ ප්‍රාප්තිය (පාස්කුව) හා කුරුසයේ තබා ඇණ ගැසීම පිළිබඳ සුභාරංචි විස්තරය කිතුණුවන්ට යම් සේ වී ද, ප්‍රීඩෝ කෘතිය මිථ්‍යා දේවතාවුන් අදහන්නන්ට හා නිදහස් මතධාරී දාර්ශනිකයන්ට ද එබඳු විය යි බර්ට්‍රන්ඩ් රසල් සාමිවරයා සිය කෘතිය මගින් පෙන්වා දෙයි.

එහෙත් සොක්‍රටීස් ගේ අවසාන මොහොතේ දී ඔහු තුළ වූ අකර්මන්‍යභාවය, අමරණීයභාවය පිළිබඳ ඔහු ගේ විශ්වාසය හා බැඳී පවතී. ප්‍රතිපත්ති මත ජීවිතය පරිත්‍යාග කළ තැනැත්තෙකු ගේ මරණය පමණක් නොව, පසු කාලයේ දී ක්‍රිස්තියානි ඉගැන්වීම් බවට පත් වූ බොහෝ මත ද විස්තර කිරීම නිසා ඡාජ්‍යෘධ වැදගත් ය. සාන්ත පාවුළු තුමාගේ හා පියවරුන් ගේ දේව ධර්මය වැඩි වශයෙන් කෙළින්ම හෝ වක්‍ර ලෙසින් ඉන් ව්‍යුත්පන්නය. ප්ලේටෝ ගැන නො සලකා දැමුවහොත් එය තේරුම් ගත නොහැකිය.

ප්ලේටෝව වහල් සේවයට විකිණූ බව ද කියැවේ. ඇතැන්ස් හා යුද වැදි නගරයක් වූ සෙරීන් හි දී මරණය හමුවේ සිටිය දී ප්ලේටෝ අගය කළ අයෙක් ඔහුව මිල දී නිදහස් කර හැරි බව ද කියැවේ. ප්ලේටෝගේ මරණය විවිධාකාරයෙන් සටහන් ගත වී ඇත. එක සටහනකට අනුව ඔහු සිය නිදි යහනේ මිය ගිය අතර ඔහු අසලින් තරුණ ත්‍රේසියන් කෙල්ලක් බටනලාවක් වැයූ බව කියැවේ. තවත් කතාවක කියැවෙන්නේ ඔහු විවාහ මංගල සාදයක දී මිය ගිය බවයි. එහෙත් ටර්ටූලියන්ට අනුව ප්ලේටෝ තම නිදි යහනේ මිය ගියේය.

**සමාලෝචනය**

ලෝකය පිළිබඳව ආධ්‍යාත්මික දර්ශනයක් ගොඩ නැගිමට

උත්සහ කළ පුද්ගලයෙකු ලෙස සඳහන් ප්ලේටෝ ඉදිරිපත් කළ දාර්ශනික අදහස් අතර සදාචාරය සම්බන්ධ අදහස් ඉතාම වැදගත් වේ. ඔහුගේ දර්ශනය සඳහා පදනම් වී තිබුණේ ඔහු පිළිගත් දර්ශනය මතය. ප්‍රපංච ලෝකය හා ආකෘති ලෝකය ලෙස දෙයාකාර අදහසක් ඉදිරිපත් කළ ප්ලේටෝට ප්‍රපංච හා ආකෘතීන් අතර සදාචාර මූලධර්මයන්ට හිමිවන්නේ වැදගත් තැනක් බව පෙන්වාදී ඇත එම පැහැදිලි කිරීමට අනුව හොඳ පිළිබඳ සංකල්පය ඉතා වැදගත්ය. මිනිසා විසින් අනුගමනය කළ යුතු ආධ්‍යාත්මික පුහුණු ක්‍රමයක් ඔස්සේ එම යහපත් ආකෘතිය පිළිබඳ අවබෝධ කරගත හැකි බවත් විවිධ පුද්ගලයන් ඒ පිළිබඳ සියලු පරමාර්ශ හඳුනාගත යුතු බවත් ඉදිරිපත් කර ඇත. එමෙන්ම එවකට ග්‍රීසියේ පැවති සියලුම සම්ප්‍රදායික සංකල්ප විවේචනය කිරීම හා එයට නව අර්ථකථන ලබාදීම ඔහු විසින් සිදු කර ඇත. විශේෂයෙන්ම එවක ග්‍රීක සමාජය පිළිගත් සදාචාර සංකල්ප ප්‍රතික්ෂේප කරන ප්ලේටෝ විසින් ඒ සඳහා නව අර්ථකථන ඉදිරිපත් කිරීමට සමත්ව ඇත. සාම්ප්‍රදායික මතවාද ක්‍රියාත්මක කිරීමේ අපහසුව පෙන්වා දෙන ප්ලේටෝ විසින් සත්‍යය හා පුහුණුවට අනුව යුක්තිය ක්‍රියාත්මක කළ යුතු ආකාරයත් එම ආචාර දර්ශනය අවස්ථාවෙන් අවස්ථාවට වෙනස් විය හැකි බවත් ප්ලේටෝ විසින් ඒ සම්බන්ධව නව සංකල්ප ඉදිරිපත් කිරීමට සමත්ව ඇත. එමෙන්ම යුක්තිය සදාචාරය පිළිබඳව කරුණු දක්වන ප්ලේටෝ රාජ්‍ය විසින් මූලිකවම යුක්තිය ක්‍රියාත්මක කරන බවත් එය රජයට අවශ්‍ය ආකාරයෙන් හසුරවන බවත් දක්වා ඇත. එමෙන්ම ආචාරධර්ම සංකල්පය ප්‍රධාන වශයෙන්ම ප්‍රඥාව ධෛර්ය හා සංයමය මත පදනම් වන බවත් දක්වන ප්ලෙටෝ පෙන්වාදෙනු ලබන්නේ සමාජයේ පාලන, ආරක්ෂක හා කම්කරු යන ත්‍රිවිධ පක්ෂ විසින් තමන්ට අදාළ රාජකාරී පමණක් ඉටුකළ යුතු බවත්ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

*අධ්‍යාපන මූලධර්ම හා පාසල් කළමනාකරණ අත්පොත*. (2010). මහරගම: ජාතික අධ්‍යාපන ආයතනය.

කලන්සූරිය, පී. ඩී. ඒ. (1973). *ග්‍රීක දර්ශනය*. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

චන්ද්‍රසේකර, එච්, එම්. (2009). *අධ්‍යාපනයේ දාර්ශනික පදනම*. කොට්ටාවඃ සාර ප්‍රකාශන.

රාජපක්ෂ, රෙජින්ටන් (1983). *ග්‍රීක දර්ශනය*. පේරාදෙණියඃ සුප්‍රා ප්‍රින්ටර්ස් ඉන්ටර්නැෂනල්.

රසල්, බර්ට්‍රන්ඩ්. (1970). *බටහිර දර්ශන ඉතිහාසය*. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

වික්‍රමසිංහ, එන්. (1995). *ග්‍රීක දර්ශනය හැඳින්වීමක්*. පිළිමතලාවඃ සුභාගයා.

වීරක්කොඩි, ඩී. පී. එම්. (2005). *ප්ලේටෝ ජනරජය*. (පරි). සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

හඳගම කුමාරි, නාමලී. (2021). *සදාචාර දර්ශනයේ ස්වභාවය*. වරකාපොළඃ ආරිය ප්‍රකාශකයෝ.

Copleston, frederick. (1966). *A History of Philosophy Volume 1*. London: S.J Burns and Oats Limited.

Brinton, Crane. (1959). *A History Western Morals*. London: Weidenefeld and Nicoloson.